---

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 02 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම | | | |
|---|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වගකීම් | වත්කම් |
| | | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 01 | 1,131 | - | - | - |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 01 | 62 | - | - | - |
| | - එම - | 01 | - | 148 | - | - |
| | - එම - | 01 | - | - | 148 | - |

---

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරීම් | 05 | - | - | - | 2,999 |
| (ඇ). | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 14 | - | - | - | 5,209 |

## 1.3.2 නොසැසඳුනු ගිණුම්

ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 19,965,664 ක් වු අතර,උපයෝගී ලේඛන/වාර්තා අනුව එම ශේෂයන්ගේ එකතුව රු.61,876,255 ක් විය.

## 1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ). ප්‍රාදේශීය සභා ගිණුම් ක්‍රමය අනුව ඉඩම් හා ගොඩනැගිලි හැර ස්ථාවර වත්කම්වල එකතුව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමෙහි ශේෂයට සමාන විය යුතු වුවත්, 2010 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම රු.6,028,071 ක් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමෙහි ශේෂය රු.13,023,206 ක් වුයෙන් ගිණුම් දෙක අතර රු.6,995,135 ක වෙනසක් අනාවරණය විය.

(ආ). 2010 දෙසැම්බර් 31 දිනට සාරාංශ මුදල් පොත අනුව අංක 1471897 දරන පොදු ගිණුමේ ශේෂය රු.16,746 ක්ද අංක 1471980 දරන කර්මාන්ත ගිණුමේ ශේෂය රු.386,757 ක් ද වූ නමුත් එය ශේෂ පත්‍රයේ පිළිවෙලින් රු.36,558 සහ රු.405,520 ලෙස අනාවරණය කර තිබුණු නමුත් ඊට හේතු පැහැදිලි නොවීය.

## 1.3.4 ගෙවිය යුතු ගිණුම්

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ). 2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 2,505,934 ක් විය.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු පළාත් පාලන සේවක දායක මුදල් රු. 639,537 ක් ණය හිමියෝ යටතේ ගිණුම්ගත කර තිබුණු නමුත් දායක මුදල් ගෙවිය යුතු නිලධාරීන්ගේ විස්තර හා ප්‍රාදේශීය සභාවේ සේවය කළ කාලය තහවුරු කරගෙන නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 24,953,172 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.883,004 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,746,506 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා , හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i). | වරිපනම් හා බදු | 425 | 425 | - | 404 | 404 | - |
| (ii). | බදු කුලී | 430 | 491 | 115 | 448 | 319 | 129 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 170 | 170 | 07 | 104 | 97 | 07 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (iv) | වෙනත් ආදායම් | 12,600 | 12,942 | 15,698 | 3,580 | 2,724 | 18,682 |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.3,052,968 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් රු.624,820 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනා ගත් ප්‍රදේශ 06 ක් සඳහා වරිපනම් බදු පනවා අයකර ගැනිමට හැකිවන පරිදි දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | විචලනය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පෞද්ගලික | | | | | | |
| පඩිනඩි | 7,077 | 8,299 | (1,222) | 7,129 | 1,857 | 5,272 |
| අනෙකුත් | 10,099 | 6,612 | 3,487 | 6,251 | 6,279 | (28) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උප එකතුව | 17,176 | 14,911 | 2,265 | 13,380 | 8,136 | 5,244 |
| ප්‍රාග්ධන වියදම් | 25,525 | 6,813 | 18,712 | 26,900 | 31,073 | (4,173) |
| මුළු එකතුව | 42,701 | 21,724 | 20,977 | 40,280 | 39,209 | 1,071 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i). | මාණ්ඩලික | 01 | 01 |
| (ii). | ද්විතිය | 02 | 05 |
| (iii). | ප්‍රාථමික | 12 | 12 |
| (iv). | වෙනත් (අනියම්,තාවකාලික) | - | 09 |
| | එකතුව | 15 | 27 |

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සීමාව ඉක්මවා බඳවාගත් සේවකයින් 12 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල වැටුප් හා දීමනා ලෙස රු.1,426,596 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 20,768,528 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂයන්හි එකතුව රු.5,949,013 ක් විය.

### 2.5.2 අය වීමට ඇති සේවක ණය

---

2010 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,113,713 ක්වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවිම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.83,418 ක් විය.

### 2.5.3 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ/සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවු 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලු වත්කම් වල වටිනාකම රු.29,419,489 ක් විය.

## 2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවන ගෙවීම්

බල ප්‍රදේශයේ හුවමාරුවන ඉඩම් මත රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අය කරනු ලබන මුද්දර ගාස්තු වලින් කොටසක් ප්‍රාදේශීය සභාවට ලැබී තිබුණු අතර එයින් 1% ක් ලෙස රු.27,500 ක් නිලධාරීන් දෙදෙනෙකුට දීමනාවක් වශයෙන් ගෙවා තිබුණු නමුත් එම ගෙවීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී නොතිබිණි.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් පවත්වා ගෙන ගිය පැල සිටුවීමේ ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් ලැබී තිබුණු ප්‍රතිපාදන වලින් පැල 1447 ක් සඳහා රු.535,390 ක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2011 මාර්තු 10 දින කරණ ලද භෞතික පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අදාල පැල ප්‍රමාණය වූ පැල 1447 ක්ෂේත්‍රයේදී දක්නට නොලැබීම සහ අදාල මුළු දුර වූ කි.මී.13 ක ප්‍රමාණයෙහි පැල 150 කට අඩු ප්‍රමාණයක් පමණක් තිබුණි.

(ii) ඇස්තමේන්තුවට අනුව වලවල් කපා පැල සිටුවා දැව කොටු යොදා ආවරණය කිරීම සහ මාස 03 ක් නඩත්තු කිරීම කළ යුතු වුවත් උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) ගෙවීම් කිරීමේදී අදාල පැල මාස 03 ක් නඩත්තු කිරීමෙන් පසු පැල ගණන් කර බලා ඒ අනුව ගෙවීම් කළ යුතු වුවත් පැල සිටුවීම අවසන් කළ විගස ගෙවීම් කර තිබුණි.

(iv) මුළු පැල ප්‍රමාණයම සිටුවා ඇති බවට කාර්මික නිලධාරීගේ වාර්තාවක් නොතිබුණි.

---

**(ආ).** කිරික්කුලම බොරළු වල ඉඩමෙහි බොරලු කැපීම වෙනුවෙන් කියුබ් 01 ක් සඳහා රු.85 බැගින් සභාවට අය කර ගැනීමට සභාව තීරණය කර වසර 15 ක් තිස්සේ ආදායම් ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සිට එම ආදායම් අය කර ගැනීම නතර කර දමා තිබුණි.

**(ඇ).** 2009 දෙසැම්බර් 31 දිනට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව නෙලුබැව මහජන පුස්තකාලයේ පොත් 137 ක ඌණතාවයට වගකිය යුතු අය හඳුනා ගෙන මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ).** 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති අංක 29 අනුව එකතුවන මුදල් දිනපතා බැංකුවේ තැන්පත් කළයුතු වුවද 2007 සහ ඊට පෙර වර්ෂවලදී රැස් කරන ලද නමුත් බැංකුවේ තැන්පත් නොකළ රු.30,818 ක මුදල් අදාල වගකිවයුතු නිලධාරින්ගෙන් අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.8 කාර්ය සාධනය

--------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභ සාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු උපයෝගි සේවාවන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාර සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.9 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන ඒකකය විසින් කරන ලද පරීක්ෂණ අනුව ඇස්තමේන්තුගත වටිනාකම රු.287,070 ක්වූ 4 ඇල සිට නාගවිහාර පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය, ඉදිකිරීම් ප්‍රමිතීන්ට අනුකූල නොවන බව වාර්තා කර තිබුණු නමුත් එම අඩුපාඩු නිවැරදි කිරීමෙන් තොරව අදාල කොන්ත්‍රාත්කරුට රු.198,786 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවීම් කර තිබුණි.

## 2.10 අභ්‍යන්තර විගණනය

-------------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3 පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.

(ආ) ආදායම් පරිපාලනය.

(ඇ) වත්කම් කළමණාකරණය.

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය.